# ශ්‍රී ලංකාවේ උපකාරක පංති සහ පාසල් සිසුන්ගේ චර්යාව පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ජයසේකර.එස්.එච්.එම්.අයි.කේ[1] සඳමාලි.ඊ.එම්.එම්.[2]* නොයා.වී.සී,[3] දිසානායක.එම්.සී.[4]
[1,2,3,4] මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකාව
*mayurisandamali5@gmail.com

**සංක්ෂිප්තය**

**හැඳින්වීම**

රටක් තුළ ආර්ථික සහ සමාජීය සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වශයෙන් අධ්‍යාපනය හැඳින්විය හැකි ය. ආචාර්‍ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා විසින් හඳුන්වා දෙන ලද නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තියත් සමඟ පළමු ශ්‍රේණියේ සිට උපාධිය දක්වා නිදහස් අධ්‍යාපනයක් ලැබීමට මෙරට සිසුන්ට අවකාශය හිමි විය (Damayanthi,2018. Sedere,2016). මෙලෙස ශ්‍රී ලංකීය අධ්‍යාපනය තුළ පවතින දැඩි තරඟකාරී රටාවත් සමඟ සිසුන් උපකාරක පංති වලට සහභාගී වීමේ ඉහළ ප්‍රවනතාවයක් පවතින අතර සමාජ සන්දර්භය තුළ නව රැල්ලක් බවට පවත්වෙමින් දැනුම ලබා දීමේ ප්‍රමුඛ ආයතනයක් වශයෙන් සහ මානව සම්පත් වැඩි දියුණු කිරීමේ දී පාසල හා සමව උපකාරක පංති ක්‍රියාකරන ආකාරය හඳුනාගත හැකිය (Gobiga .2017, Damayanthi.2018 ). ශ්‍රී ලංකාව තුළ මෙම උපකාරක පන්ති ක්‍රියාත්මක වීමේ දී ත්වැදැරුම් උපකාරක පංති රටාවක් පවතී. එනම් ගුරුවරයා සහ සිසුවා පමණක් සහභාගිවන උපකාරක පන්ති, සුදුසුකම් සැපිරූ ගුරුවරයෙක් මෙහෙයවන කුඩා කණ්ඩායම් පන්ති සහ ගුරුවරයා සහ විශාල සිසුන් පිරිසක් සහභාගිවන ශාලා පන්ති යන පන්ති රටාවන් වේ ( Pallegedara.2017). මෙලෙස පවතින උපකාරක පන්ති සඳහා වන අවධානය දිනෙන් දින ඉහළ යයි. මෙම උපකාරක පංති අධ්‍යාපනය තුළ ප්‍රබල භූමිකාවක් රඟ දක්වන කාල වකවානුවක මෙම උපකාරක පංති හේතුවෙන් පාසල් සිසුන්ගේ ගොඩ නැගි පවතින චර්යාව පිළිබඳ අධ්‍යයනය වැදගත් වේ. පුද්ගලයන් විසින් සිදුකරන මැනිය හැකි, නිරීක්ෂණය කළ හැකි සහ නැවත නැවත සිදු කළ හැකි දෙයක් වශයෙන් චර්යාව හැඳින්වේ. චර්යාව ඍජුවම සහ වක්‍රව දැකිය හැකි අතර ඍජුවම පවතින චර්යාව පරිසරයත් සමඟ කටයුතු කිරීමේ දී හඳුනාගත හැකි අතර වක්‍ර චර්යාව තීරණ ගැනීමේ සහ ආකල්ප වැනි දෑ පුද්ගලයන් විස්තර කරන ආකාරයෙන් හඳුනාගත හැකිය (Bicared, Bicared.& the IRIS Center. 2012). ඒ අනුව පාසල් සිසුන් තුළ උපකාරක පංති හේතුවෙන් ගොඩ නැගී ඇති චර්යාව අධ්‍යයනය කිරීම ප්‍රධාන අරමුණ කර ගනිමින් මෙම අධ්‍යයනය සිදුකරන ලදී. මෙම ප්‍රධාන අරමුණ යටතේ අනු අරමුණ වශයෙන් ක්ෂෙත්‍රය තුළ පාසල් සිසුන්ගේ දෛනික චර්යාවට උපකාරක පංති බලපෑම් කරනවාද යන්න අධ්‍යයනය කිරීම සහ උපකාරක පංති මත පාසල් සිසුන් නිර්මාණය කරගෙන පවතින චර්යාවන් පිළිබඳ ඔවුන් තර්කනයට ලක්කරන ආකාරය අධ්‍යයනය කරන ලදී.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනයේ අධ්‍යයනය ක්ෂේත්‍රය වශයෙන් සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ අවිස්සාවේල්ල ප්‍රදේශයේ පිහිටි රත්නපුර අනුර මහා විද්‍යාලය සරල සසම්භාවී ක්‍රමය යටතේ තෝරගන්නා ලදී. එහිදී සම්භාවිත නියැදි ක්‍රමය යටතේ බහු පියවර නියැදි ක්‍රමය මඟින් දත්ත දායකයින් තිස්දෙනෙකුගෙන් යුත් නියැදියක් තෝරාගන්නා ලදී. එනම් දත්ත ලබාගැනීමේ දී ද්විතික දත්ත සහ ප්‍රාථමික දත්ත යොදාගත් අතර ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ දී සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි ක්‍රම මෙන්ම ද්විතීක දත්ත ලබා ගැනිමේ දී සංඛ්‍යා ලේඛන වාර්තාවන්, පොත් පත්, සඟරා, පුවත් පත්, ආයතනගත තොරතුරු සහ

අන්තර්ජාලය මගින් ලබා ගත් තොරතුරු උපයෝගී කරගනු ලැබිණි. එලෙස ලබා ගත් දත්ත ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කරන ලදි.

**ප්‍රතිඵල**

පාසල් සිසුන් තුළ උපකාරක පංති හේතුවෙන් ගොඩ නැගී ඇති චර්යාව පිළිබඳ මෙම අධ්‍යයනයට අනුව පාසල් සිසුන්ගෙන් 83% ක් වූ බහුතර මතය වී ඇත්තේ ඔවුන් උපකාරක පංති යෑමට වඩා පාසල් යෑමට රුචිකත්වයක් දක්වන බවයි.

පාසල් ශිෂ්‍යයන් සඳහා ඔවුන්ගේ විවේක කාලයන් වැදගත් වන අතර එය ඔවුන්ගේ සමාජානුයොජනයට සහ යහපත් සෞඛ්‍යය තත්ත්වය ඇති කරමින් නිරෝගී චර්යාවකින් යුක්තව ජීවත් වීමට අවකාශ සකසන බව ශිෂ්‍යයන්ගේ විවේක කාලයන් පිළිබඳ පර්යේෂණ තුළින් සනාත කොට ඇත. නමුත් අදවන විට පාසලෙන් පසු සිසුන්ගේ විවේක කාලය අහිමි වී ඇති අතර ජන ලේඛණ සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ළමා ක්‍රියාකාරකම් පිළිබඳ වර්තාවට අනුව පෙන්වා දී ඇත්තේ පාසල් කාලය අවසන් වන සිසුන් 4.7% බාහිර පන්ති තුළ සිය සවස් කාලය ගත කරන බවයි (CHILD ACTIVITY SURVEY.2016. Strazdiene, Strukcinskiene,Michaelsson& Griskonis.2017). මෙම අධ්‍යයනයේ දත්ත අනුව සිසුන්ගෙන් 46% වූ බහුතරය උපකාරක පංති වලට සහභාගී වීම හේතුවෙන් සෙල්ලම් කිරීමට වන කාලය අහිමි වී ඇති බව පෙන්වා දෙන ලද අතර 10% උපකාරක පංති වලට සහභාගී වීම හේතුවෙන් සෙල්ලම් කිරීමට වන කාලය අහිමි වීම සම්බධව මධ්‍යස්ථව අදහස් දක්වයි. එසේම පාසල් අවසන් වූ පසු නිවසට නොගොස්ම උපකාරක පංතින්ට සහභාගී වන බව 16%ක් දත්ත දායකයින් පෙන්වා දෙන ලදී. එසේම සිසුන් 84% ක් පාසල් කාලය අවසන් වී නිවසට පැමිණ උපකාරක පංතින්ට සහභාගීවන බව පෙන්වා දී ඇත. මේ අනුව පෙනි යන කරුණ නම් ළමුන් අධ්‍යාපන රාමුන් තුළ දිර්ඝව සිරවීම මත ඔවුන්ගේ චර්යාව අධ්‍යාපනය කේන්ද්‍ර කොට නිර්මාණය වී ඇති මුත් ඒ සම්බන්ධව තෘප්තිමත් බවක් සිසුන් තුළ නොමැති බවයි.

පාසල් සිසුන් උපකාරක පංති සඳහා යොමුවීමේ දී ළමුන්ගේ අධ්‍යාපන ලඟා කර ගැනිම්, දෙමාපිය අධ්‍යාපන මට්ටම, ගුරුවරු සහ දෙමාපියන් අතර පවතින සම්බන්ධතාවයේ ස්වභාවය, විධිමත් අධ්‍යාපන පද්ධතියේ දුර්වලතා වැනි හේතු බලපා ඇති බව පාසල් සිසුන් උපකාරක පංති සඳහා යොමුවීමට බලපාන සාධක පිළිබඳ අධ්‍යයන තුළින් සනාථ කර ඇත (Damayanthi.2018). ඒම තත්ත්වය පාසල් සිසුන් තුළ උපකාරක පංති හේතුවෙන් ගොඩ නැගී ඇති චර්යාව පිළිබඳ මෙම අධ්‍යයනය තුළ පහත පරිදි හඳුනාගත හැකිය. එනම් පාසල් සිසුන් උපකාරක පන්ති සඳහා යොමු වීමට වන හේතු ලෙස දැනුම ලබා ගැනීම, ගුරුවරුන්ගේ ඉගැන්වීම් රටාව, දෙමාපිය බලපෑම සහ මිතුරු ඇසුර යන සාධක පෙන්වා දිය හැක.

සිසුන් උපකාරක පංති යෑම පිළිබද තර්කනයට ලක්කරනුයේ ඔවුන්ට දැනුම ලබා ගැනීමේ අවශ්‍යතාව මත උපකාරක පංතිවලට සහභාගී වන බවයි. නමුත් 16%වූ පාසල් සිසුන් ප්‍රකාශ කරනුයේ දෙමාව්පියන්ගේ පෙළඹ වීම මත උපකාරක පංතින්ට සහභාගී වන බවයි. එසේම නියැදියේ 90% වූ පාසල් සිසුන් ප්‍රකාශ කරනුයේ දෙමව්පිය කැමැත්ත හේතුවෙන් ඔවුන් උපකාරක පංතිවලට සහභාගීවන බවයි. ස්වකැමැත්ත මත උපකාරක පංතිවලට සහභාගී වන ප්‍රමාණය නියැදියේ 03% වේ.

**නිගමන**

මේ අනුව පෙනී යන්නේ පාසල් සිසුන් උපකාරක පන්ති සඳහා යොමු වීමට දැනුම ලබා ගැනීම, ගුරුවරුන්ගේ ඉගැන්වීම් රටාව, දෙමාපිය බලපෑම සහ මිතුරු ඇසුර යන සාධක බලපා ඇත. පාසල් සිසුන් ඔවුන්ට ආවේණික වූ චර්යාව දෙමව්පිය බලපෑම සහ දැනුම පසුපස හබා යෑමේ රුචිකත්වය මත නිර්මාණය කර ඇති බවයි. එසේම උපකාරක පංතින්ට සහභාගී වීමේ දී ඇති කරගෙන පවතින චර්යාව පිළිබඳ ඔවුනගේ තර්කනය ලක්කිරීමේ දී සමාජ සංස්ථවේ බලපෑම මත ගොඩ නැගෙන ආකාරයක් හදුනාගත හැකිය. පාසල් සිසුන්ගේ දෛනික චර්යාව උපකාරක පංති කේන්ද්‍ර කර ගනිමින් නිර්මාණය වී

ඇති අතර ඒ අනුව පාසල් සිසුන්ගේ සමස්ථ චර්යාව උපකාරක පංති කේන්ද්‍ර කර ගනිමින් නිර්මාණය වී ඇත.

***ප්‍රවේශ පද : ශ්‍රී ලංකාව. පාසල් සිසුන්, උපකාරක පංති, චර්යාව***

**මූලාශ්‍ර**

2017. Annual Report, School Census . Ministry of Education- Sri Lanka

2016. CHILD ACTIVITY SURVEY . Department of Census and Statistics. Ministry of National Policies and Economic Affairs

Damayanthi.B.W.R.(2018). *THE DETERMINANTS OF DEMAND FOR PRIVATE TUTORING IN SRI LANKA*. International Journal of Education, Learning and Development Vol.6, No.9, pp.21-37

Gobiga .K.(2017*).“THE STUDY ON PARENTS PERCEPTION ON EMERGING TREND OF PRIVATE TUITION CLASSES TOWARDS THEIR CHILDREN’S EDUCATION IN KALUWNCHIKUDY D.S DIVISION IN BATTICALOA DISTRICT”*. Proceedings of 7th International Symposium, SEUSL, 7th & 8th December 2017.

Pallegedara.A.(2017).Demand for Private Tutoring in a Free Education Country. The Case of Sri Lanka. Wayamba University of Sri lanka.

Strazdiene.N., Strukcinskiene.B., A.Michaelsson.A. R., Griskonis.S.(2017). *ORGANIZING LEISURE TIME IN A FAMILY FOR ELEMENTARY SCHOOL CHILDREN IN THE CONTEXT OF HEALTH EDUCATION*. SVEIKATOS MOKSLAI / HEALTH SCIENCES IN EASTERN EUROPE.

Bicared.S.C, Bicared.D.V & the IRIS Center. (2012). Defining behavior. Retrieved on 01/12/2019 from http://iris.peabody.vanderbilit.edu/case_studies/ICS-015.pdf

Sedere.M.U.(2016). Educational Reforms Beyond Kannangara for the 21st century. National Institute of education. Maharagama; Sri lanka.